## වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 හා 02 යටතේ නිකුත් කරන ලද බදු සහන වාහන ආනයන බලපත්‍රවල කාලය දීර්ඝ කිරීම.

වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01 හා 02 යටතේ නිකුත් කරන ලද බදු සහන වාහන ආනයන බලපත්‍රවල කාලය දීර්ඝ කර ගැනීම පිළිබඳ විධිවිධාන වහාම ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කර ඇත.

02. බදු සහන වාහන ආනයන බලපත්‍රයේ සඳහන් වලංගු කාල සීමාව ඉකුත් වීමට පෙර වාහනයක් ආනයනය කිරීම පිණිස ණයවර ලිපියක් විවෘත කර ඇති බලපත්‍ර සඳහා වලංගු කාලය දීර්ඝ කිරීමක් අවශ්‍ය නොවේ. ණයවර ලිපිය බලපත්‍රයේ වලංගු කාල සීමාව ඇතුලත විවෘත කර ඇති බව රේගු දෙපාර්තමේන්තුව වෙත සනාථ කිරීම පමණක් ආනයනය කල වාහනය සඳහා බදු සහන ලබාගැනීමට ප්‍රමාණවත් වේ.

03. බදු සහන ආනයන බලපත්‍රයේ වලංගු කාලසීමාව ඉකුත්වීමට ප්‍රථමයෙන් වාහනයක් ආනයන කිරීමට ණයවර ලිපි විවෘත කිරීමට නොහැකි වූ බලපත්‍රලාභීන් සඳහා බලපත්‍රවල වලංගු කාල සීමාව දීර්ඝ කිරීම සලකා බලනු ලබන්නේ පහත සඳහන් නිර්ණායකයනට යටත්ව පමණි.

i කාලය දීර්ඝ කිරීම සඳහා අයදුම් කරන දිනට බලපත්‍රලාභියා සතුව වලංගු බදු සහන වාහන ආනයන බලපත්‍රයක් තිබිය යුතුය.

ii කාලය දීර්ඝ කිරීම සඳහා අයදුම් කළ හැක්කේ බලපත්‍රයේ සඳහන් වලංගු කාලසීමාව ඉකුත්වීමට පූර්වයෙන් වූ සති දෙකක් ඇතුලතදී පමණි. කාලය ඉකුත් වූ බලපත්‍ර කිසිදු දීර්ඝ කිරීමක් සඳහා සලකා නොබලනු ඇත.

iii බදු සහන වාහන ආනයන බලපත්‍රය මත වාහනයක් ආනයනය කිරීම සඳහා ණයවර ලිපියක් විවෘත නොකිරීමට හේතු සඳහන් කරමින් බලපත්‍රලාභියා විසින් සද්භාවයෙන් කරනු ලබන ප්‍රකාශයක් බලපත්‍රය දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

iv. ඉදිරිපත් කරන කරුණු සලකා බලා එක් වතාවක් පමණක් බලපත්‍රයක වංලගු කාල සීමාව දීර්ඝ කරනු ලැබේ. මෙම දීර්ඝ කරන ලද කාලය තුළ ණයවර ලිපි විවෘත කිරීමට අපොහොසත් වන කිසිදු බලපත්‍රයක් සඳහා තවදුරටත් කාලය දීර්ඝ කිරීම පිළිබඳ සලකා නොබලනු ඇත.

04. වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 03 යටතේ බදු සහන පදනම මත දේශීය වශයෙන් නිෂ්පාදනය/එකලස් කරන වාහනයක් මිලට ගැනීමට අපේක්ෂා කරන බලපත්‍රලාභීන් බලපත්‍රයේ සඳහන් වලංගු කාල සීමාව ඉකුත්වීමට පෙර වාහනයක් මිලට ගැනීම සඳහා ගිවිසුමකට අදාල දේශීය නිෂ්පාදකයා/එකලස්කරන්නා සමඟ එළඹ තිබේ නම් එම බලපත්‍ර වෙනුවෙන් කාලය දීර්ඝ කිරීමක් අවශ්‍ය නොවේ.

අධ්‍යක්ෂ ජනරාල්
වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

2007 දෙසැම්බර් 18 දින